Anuradha

මගේ අංකය :-MSD/SB09/12/2025 (ii)

වෛද්‍ය සැපයීම් අංශය

357 ඩීන්ස් පාර

කොළඹ 10

2025.11.04

කළමණාකරු

**Ewis Peripherals (Pvt) Ltd**

මිල ගණන් කැඳවීමයි.

EWIS PERIPHERALS (PVT) LTD.
17
13 NOV 2025
RECEIVED

මිල ගණන් අංකය MSD/SB09/12/2025 (ii)

**Data Center සඳහා UPS (Uninterruptible Power Supply) මිලදී ගැනීම සඳහා අයදුම් පත් කැඳවීම**

**වෛද්‍ය සැපයීම් අංශය - සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය සැපයීම් අංශයේ දත්ත මධ්‍යස්ථානය සඳහා UPS (Uninterruptible Power Supply) මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමයි.

2. මේ සඳහා අයදුම්පත්‍ර ලබා ගැනීමට, අදාල ආයතනයෙන් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කල යුතු අතර , ආපසු නොගෙවන **රු.1000.00** ක ගාස්තුවක් කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවතේ අංක 357, හි පිහිටි වෛද්‍ය සැපයීම් අංශයේ සරප් වෙත,මුදලින් ගෙවීමෙන් හා ඊට අදාල ලදුපත ඉදිරිපත් කිරීමෙන් පසු **2025.11.06** වන දින සිට **2025.11.19** දින ප.ව 2.30 දක්වා, සතියේ වැඩ කරන දින වල පෙ.ව 9.30 සිට ප.ව 2.30 අතර කාලය තුල පමණක් අදාල ඉල්ලුම්පත් ලබා ගත හැකිය.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2025.11.20** දින ප.ව 2.00 හෝ ඊට පෙර ලැබෙන පරිදි ලි.ප.තැ එවීම හෝ වෛද්‍ය සැපයීම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී (සැපයීම්) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල හැකිය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම් පත් එවිය යුතු ලිපිනය : **සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, වෛද්‍ය සැපයීම් අංශය 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,කොළඹ 10** යනුවෙන් විය යුතු අතර අයදුම්පත් එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ මිල ගණන් අංකය හා විවෘත කරණු ලබන දිනය පැහැදිලිව දක්වා තිබිය යුතුය.

4. මේ පිළිබඳ වැඩි විස්තර වෛද්‍ය සැපයීම් අංශයේ සැපයීම් ශාඛාවෙන් ලබා ගත හැක.
දුර. අංකය : 011-2694113/4

**ප්‍රධාන ගණකාධිකාරී (සැපයීම්)**
**වෛද්‍ය සැපයීම් අංශය**

ඩී. එම්. එල්. එස්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී (සැපයීම්)
වෛද්‍ය සැපයීම් අංශය.
අංක 357.
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත.
කොළඹ 10.